# ඩාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

42 වන කාණ්ඩය | 02 වන කලාපය | 2026 ජනවාරි කලාපය


# කාන්තාවන්ට එරෙහි ඩිජිටල් ප්‍රචණ්ඩත්වය තුරන් කරමු






**කාන්තා** ප්‍රචණ්ඩත්වයට එරෙහිව දින 16 ක්‍රියාකාරී වැඩසටහන සෑම වසරකම නොවැම්බර් 25 දින සිට දින 16ක කාලයක් පුරාවට පැවැත්වෙන අතර 2025 වර්ෂය සඳහා තේමාව වන්නේ "කාන්තාවන්ට එරෙහි ඩිජිටල් ප්‍රචණ්ඩත්වය වළක්වමු" යන්නයි. මෙයට හේතුව වන්නේ වර්තමානය වන විට දී කන්තාව ඩිජිටල් අවකාශය තුළ බහුල වශයෙන් ප්‍රචණ්ඩත්වයට ලක් වීමයි. වෙළඳ කලාපවල සේවය කරන කාන්තාවන්ගේ සමාජ ආර්ථික දේශපාලන අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි ඩාබිඳු සාමූහිකය මඟින් මෙකී කාන්තා ප්‍රචණ්ඩත්වයට එරෙහිව දින 16 ක්‍රියාවලිය වෙනුවෙන් වැඩසටහනක් පවත්වනු ලැබීය.

දැනිලා තියෙනවාද මනුස්සයෙක් තවත් පිරිසක් ඉදිරියේ විවිධ දුර්වලතා ගැන කතා කරමින් අපහසුතාවයට ලක් කරනකොට දැනෙන හැඟීම, ගැහැණු අපි ආත්ම ගරුත්වය ගැන හිතන ජීවීන් කොට්ඨාසයක්. සැබැවින්ම ගැහැණු කියන්නේ ආදරය රැකවරණය ගෞරවය බලාපොරොත්තු වෙන පිරිසක්. කාන්තාව හිංසාවට ලක්වෙන විවිධ ආකාර ඇත. ඒ අතර

2 වන පිටුවට...

## ඇතුළු පිටු


03 පිටුව - මහන මැෂිමට සැඟවුනු සෞඛ්‍යය
04 පිටුව - දිට්වා සුළි කුණාටුවත් සමඟ සංකීර්ණ වූ කම්කරු ජීවිත
05-07 පිටු - අපේ වැඩ
08 පිටුව - ජාතික හා ජාත්‍යන්තර වැඩ
09 පිටුව - අපේ අයිතිවාසිකම්
10 පිටුව - සිතුවිල්ල/ප්‍රහේලිකාව
11 පිටුව - කවි පිටුව/සමාජ ආරක්ෂාව

## ඩාබිඳු සාමූහිකය

221, වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka
Web : www.dabinducollective


# 2026 අභිමුඛ ස්ත්‍රී විරෝධී ප්‍රහාර

නව වසර සමරනවාත් සමඟ රටේ ආන්දෝලනාත්මක ප්‍රශ්නයක් වූයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියයි. රටේ අගමැතිනිය කාන්තාවක් වූ නිසාම මෙන්ම අධ්‍යාපන ඇමතිණිය වූ නිසාම ඇයව ඉලක්ක කොට ගනිමින් දේශපාලන ප්‍රචණ්ඩත්වය කිසිඳු පාලනයකින් තොරව විදහා දක්වයි.

සමාජ තලය තුළ කාන්තාවන්ගේ නියෝජනය ලබා ගැනීමට මහත් වෙහෙසක් දැරිය යුතුය. කැපකළ යුතුය. එවැනි තත්ත්වයක් තුළ සමාජ මාධ්‍යයද උපයෝගී කොට ගනිමින් කෙරෙන වෛරී ප්‍රකාශ අප තරයේ හෙළා දකින්නේම කාන්තා නායකත්වය මොට කිරීමට ගන්නා මේ උත්සාහය සමානාත්මතා පදනමට ප්‍රජාතන්ත්‍රවාදී යහපැවැත්මට කරන්නා වූ නිගාවකි. ජාත්‍යන්තර මූලධර්ම හා යමින් තිබිය දී මෙවැනි ස්ත්‍රී විරෝධී මත දැරීම තුළ සිදුවන්නේ එක්සත් ජාතීන්ගේ සම්මුතීන්වලට එරෙහි වීමකි. රටේ අගැමතිතුමිය ඇතුලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ට මෙන්ම සියලුම ස්ත්‍රීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී අත්‍යවශ්‍යතාවයකි. එහෙයින් ඒවා දිනා ගැනීම වෙනුවෙන් අප නිරන්තරයෙන් පෙනී සිටින අතර බලපෑම් කිරීමට ද මැදිහත් වන්නෙමු.

මෙම වෛරී, කුරිරු ප්‍රකාශනයන් තවදුරටත් කරගෙන යාම පිණිස සිවිල් සංවිධානවල ක්‍රියාකාරීත්වයද හවුල් කරගනිමින් මන්ත්‍රීවරු පාර්ලිමේන්තුව තුළ හැසිරෙන ආකාරය ලැජ්ජා සහගතය. ආන්තීකරණයට ලක් වූ පුද්ගලයන් භාවිත කරමින් ඔවුන්ගේ අනන්‍යතාවය හාස්‍යයට ලක් කරමින් ඩාබිඳු වැනි සංවිධාන පිළිබඳ අසත්‍ය ප්‍රචාර පාර්ලිමේන්තු වරප්‍රසාද ලබා ගනිමින් ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස ප්‍රකාශයන් නිකුත් කිරීම ගැන වගකිව යුතු විපක්ෂයක කාර්යය භාරය නොවේ. මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව් මූලික අයිතිවාසිකම් රාමුව යටතේ සිවිල් සමාජ සංවිධාන වෙත ප්‍රකාශනයේ නිදහස, සංවිධානය වීමේ නිදහසට වන බාධාවකි. වසර 41කට අධික කාලයක සිට ඩාබිඳු සාමූහිකය සිවිල් සමාජ අවකාශය ආරක්ෂා කිරීම වෙනුවෙන් වූ ක්‍රියාකාරීත්වයට ප්‍රජාතන්ත්‍රවාදී රාමුවකින් සමානාත්මතා ප්‍රවේශයක් හා යුක්තිය උදෙසා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය දෘෂ්ටිකෝණයකින් යුතුව කටයුතුකොට ඇත්තෙමු. එම නිසා අසත්‍ය කෲර ප්‍රචාර තුළින් අපගේ ක්‍රියාකාරීත්වය අඩපණ කළ නොහැකි බව තරයේ ප්‍රකාශ කර සිටිමු.


1 පිටුවෙන්...

## කාන්තාවන්ට එරෙහි

ශාරීරිකව හිංසනයට ලක්කිරීම, මානසික හිංසනයට ලක්කිරීම, වාචිකව හිංසනයට ලක්කිරීම පෙන්වා දිය හැකිය. කර්මාන්තශාලා තුළ, සමාජය තුළ පවතින මේ තත්ත්වය හමුවේ සහ රටේ පැවති අයහපත් කාළගුණික තත්ත්වයට මුහුණ දෙමින් ඉතා අසීරුවෙන් කාලය ගත කරන බියගම, කටුනායක කම්කරු සහෝදරියන් සඳහා ඉකුත් දෙසැම්බර් 21 වන දින බියගම පී. ටී. ගාර්ඩන් හෝටල් පරිශ්‍රයේ දී දැනුම සහ විනෝදය පිරි තරුණ කඳවුරක් පවත්වන්නට විය. මෙම වැඩසටහන නිහඬ පා ගමනකින් ආරම්භ කරන ලදී. මෙහිදී බියගම සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයේ අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී එස්. එස්. විතාන මහතා විසින් දේශනයක් පැවැත් වූ අතර එහිදී ගංවතුර තත්වයකට මුහුණ දුන් පසු හැසිරිය යුතු ආකරය පිළිබඳව සාකච්ඡා කරන ලදී. සෞඛ්‍ය පරීක්ෂක නිළධාරීතුමා ද මෙහිදී තවත් කරුණු රැසක් බෙදා ගන්නා ලදී. එසේම මනෝ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක් මනෝ උපදේශක ගංගා මහත්මිය විසින් පවත්වන ලදී. ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය, සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ ඩිජිටල් ආරක්ෂාව යන තේමාවන්ට අනුකූලව සේවකයින් සඳහා විනෝද ක්‍රීඩා රැසක් පැවැත් වූ අතර අපගේ සහෝදරත්ව කව සාකච්ඡා මාලාව සහ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය දැනුවත් කිරීමේ සැසි පුරාවට සේවකයින් ලබා ගත් දැනුම මෙහි පදනම් විය.

මෙම අවස්ථාවේ පවත්වනු ලැබූ තරඟ විනිශ්චය කරනු ලැබුවේ TGCWU සංවිධානයේහි අධ්‍යක්ෂිකා ලලිතා දේද්දුවකුමාර මහත්මිය, ඈන් ගාල්ලගේ මහත්මිය, නෙළුම්මාලි දේවසිංහ මහත්මිය සහ මධු හෙට්ටිආරච්චි මහත්මිය විසිනි. එසේම ආසියානු පොදු වැටුප් ව්‍යාපාර සංවිධානයේ අභිරාමි සිවලෝගනාදන් මහත්මිය ද මෙම අවස්ථාවට සම්බන්ධ විය. මෙහි දී ජයග්‍රාහකයන්ට වටිනා ත්‍යාග ප්‍රදානය කිරීමක් ද සිදු විය.





# මහන මැෂිමට සැඟවුනු සෞඛ්‍යය

ශ්‍රී ලංකාවේ දහස් ගණනක් කාන්තා ඇඟළුම් සේවිකාවන්ට, සෞඛ්‍ය දැනුවත් කිරීම යනු හුදෙක් ම මසකට පමණක් සීමා වූ ව්‍යාපාරයක් පමණක් නොවේ. එය පැවැත්ම, අවස්ථා සහ ගෞරවය පිළිබඳ බරපතල කාරණයකි.

කාන්තාවන් ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තයේ හදවත වේ. ඔවුන් කර්මාන්තශාලා බලගන්වයි, රටට විදේශ විනිමය උපයති, සහ ඔවුන්ගේ පවුල් රැක බලා ගනී. එහෙත්, සෞඛ්‍යය හා යහපැවැත්ම සම්බන්ධයෙන් ගත් කල, ඔවුන්ගේ හඬ සහ අවශ්‍යතා ආන්තීකරණයට ලක් වේ. බොහෝ ඇඟලුම් සේවකයින් දිගු වැඩමුර, ප්‍රමාණවත් නොවන විවේකය, පෝෂ්‍යදායී නොවන ආහාර, ආතති සහගත තත්වයන් යටතේ දරාගත නොහැකි නිෂ්පාදන ඉලක්ක මත ම දිවිය ගෙවා දමයි. විවේකය, ස්වයං රැකවරණය හෝ වෛද්‍ය පරීක්ෂණ සඳහා යොමු වීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බැවින්, පියයුරු වේදනාව, තෙහෙට්ටුව හෝ ගැටිති වැනි ගැටළු බොහෝ විට නොදැනුවත්වම නොසලකා හරියි. සමහරුන්ට ඔසප් වීම, ප්‍රජනක සෞඛ්‍යය හෝ පියයුරු පිළිකා වැනි කාන්තා සෞඛ්‍ය මාතෘකා සාකච්ඡා කිරීම පවා රැකියා ස්ථානයේ ලැජ්ජා සහගත ලෙස සැලකේ. මෙම නිහඬතාවයන් ජීවිත අහිමි කරයි. පියයුරු පිළිකාවෙන් කාන්තාවන් බේරා ගැනීම සඳහා කල් ඇතිව හඳුනා ගැනීම මූලික යතුර වේ. නමුත් දැනුවත්භාවය, කාලය සහ පරීක්ෂණ සායන සඳහා ප්‍රවේශය නොමැතිකම බොහෝ සේවකයින් අවදානමට ලක් කරයි.

ඔවුන් මුහුණ දෙන මූලික බාධක අතරට රෝග ලක්ෂණ සහ වැළැක්වීම පිළිබඳ සීමිත දැනුවත්භාවය, සෞඛ්‍ය පරීක්ෂණවලට සහභාගී වීමට නිවාඩුවක් හෝ ආයතනවල නම්‍යශීලීභාවයක් නොමැතිකම, කර්මාන්තශාලා තුළ කාන්තා සෞඛ්‍යය පිළිබඳ අධ්‍යාපනය හෝ සුවතා වැඩසටහන් නොමැතිකම, පවතින එකම විවේකී දිනය ඉරිදා බැවින් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලවල සේවය ලබා ගැනීමට දුෂ්කරතා, සේවා ස්ථානයේ වෘත්තීය සෞඛ්‍ය සුරැකෙන අන්දමින් පහසුකම් සලසා නොදීම සහ මූල්‍ය බාධක වේ.

සෞඛ්‍යය වරප්‍රසාදයක් නොවේ. එය අයිතියකි. ඇය කාර්යාල කාමරයක සිටියත් මහන මැෂිමක් පිටුපස සිටියත්, සෑම කාන්තා සේවිකාවක්ම ලැබිය යුතු අයිතියකි. දැනුවත්භාවයේ සිට ක්‍රියාවට නැංවීම දක්වා කාන්තා කම්කරු අයිතිවාසිකම් සහ සවිබල ගැන්වීම වෙනුවෙන් පෙනී සිටින සාමූහිකයක් ලෙස, ඩාබිඳු ඉල්ලා සිටින්නේ නිදහස් වෙළඳ කලාපවල ස්ථානීය පියයුරු පරීක්ෂාව සහ දැනුවත් කිරීමේ සැසි, වෛද්‍ය පරීක්ෂණ සහ ප්‍රතිකාර සඳහා වැටුප් සහිත නිවාඩු, කාන්තා සෞඛ්‍යය පිළිබඳ විවෘත සංවාද සාමාන්‍යකරණය කරන සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන්, සේවා ස්ථාන සහ නේවාසිකාගාර වෙත ළඟා වීම සඳහා මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සමඟ සහයෝගීතාවය වේ. ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය අයිතිවාසිකම් පිළිබඳ අපගේ අඛණ්ඩ වැඩවලට පියයුරු පිළිකා දැනුවත්භාවය ඒකාබද්ධ කිරීමෙන්, කාන්තාවන්ට කතා කිරීමට, ඉගෙනීමට සහ බියෙන් හෝ ලැජ්ජාවකින් තොරව තම ශරීර රැකබලා ගැනීමට ආරක්ෂිත බවක් දැනෙන අවකාශයන් නිර්මාණය කළ හැකිය. පියයුරු පිළිකා දැනුවත්භාවය ගැන සාකච්ඡා කරන විට, අප අඳින සෑම ඇඳුමකම පිටුපස ම සිටින නොපෙනෙන දෑත් හඳුනා ගැනීම කළ යුතුය. අපි කාන්තා ඇඟළුම් සේවිකාවන් ඇතුළත් සෞඛ්‍ය ප්‍රතිපත්ති ඉල්ලා සිටිමු. සෑම කාන්තාවකගේම පන්තිය, සේවා ස්ථානය හෝ ආදායම නොසලකා ඇගේ ජීවිතය සහ සෞඛ්‍යය වැදගත් බව තහවුරු කරමු. අපිට එක්ව, කාන්තා ශ්‍රමය අගය කරන, ඔවුන්ගේ හඬ ඇසෙන සහ ඔවුන්ගේ සෞඛ්‍යය ආරක්ෂා කරන අනාගතයක් නිර්මාණය කළ හැකිය.

යසාරා විඳුමිණී



# අර්බුදකාරී කාලවලදී නිදහස් වෙළඳ කලාප සේවකයින් අනාරක්ෂිතව සිටින්නේ ඇයි?

ශ්‍රී ලංකාවට බලපෑ දිට්වා සුළි කුණාටුව හුදෙක් ස්වාභාවික විපතක් පමණක් නොවේ. එය රටේ ආරක්ෂණ පද්ධති කෙතරම් ගැඹුරින් අසමානද යන්න පිළිබඳ ප්‍රබල මතක් කිරීමක් විය. ගංවතුර මාර්ග, නිවාස සහ සේවා ස්ථාන ජලයෙන් යට වූ විට, අර්බුධයෙන් ආරක්ෂා වූයේ කවුරුන්ද සහ විපතට පත් වූයේ කවුරුන්ද යන්න හෙළි කළේය. වඩාත්ම බලපෑමට ලක් වූවන් අතර නිදහස් වෙළඳ කලාප සේවකයින් ද වූහ, ඔවුන් ශ්‍රී ලංකාවේ අපනයන මත පදනම් වූ ආර්ථිකය පවත්වා ගෙන යන නමුත් හදිසි අවස්ථාවල දී නොපෙනී සිටින ශ්‍රම බලකායකි. දිට්වා සුළි කුණාටුව ඔවුන්ගේ ආර්ථික දායකත්වය සහ ආපදා ඇති වූ විට ඔවුන්ට ලැබෙන ආරක්ෂාව අතර හිදැස හෙළි කරන අවදි කිරීමේ ඇමතුමක් බවට පත්විය.

ග්‍රාමීය ප්‍රදේශවලින් සංක්‍රමණය වන ප්‍රධාන වශයෙන් තරුණ කාන්තාවන් වන නිදහස් කලාප සේවකයින් දැනටමත් ආර්ථික ආරක්ෂාවේ මායිම්වල ජීවත් වෙති. දිගු වැඩ කරන වේලාවන්, අඩු වැටුප්, ජීවන වියදම් ඉහළ යාම සහ අනාරක්ෂිත නිවාස, එදිනෙදා දිවියේ යථාර්ථයන් වේ. බොහෝ කම්කරුවන් නිදහස් වෙළඳ කලාප අසල කුඩා නේවාසික කාමර කුලියට ගන්නා අතර, ඒවා බොහෝ විට පහත් බිම් සහ ගංවතුරට ගොදුරු විය හැකි ප්‍රදේශවල පිහිටා ඇත. දිට්වා සුළි කුණාටුවත් සමඟ ඇති වූ අඛණ්ඩ වර්ෂාපතනයක් සහ ඉහළ යන ජලය මට්ටම් තුළ දී නේවාසිකාගාර ජලයෙන් යට විය, පුද්ගලික බඩු බාහිරාදිය විනාශ විය, හැඳුනුම්පත් සහ බැංකු වාර්තා වැනි අත්‍යවශ්‍ය ලියකියවිලි නැති විය. සිය පවුල් වලින් දුර බැහැරින් සිටීම සහ සීමිත ඉතිරිකිරීම් සමඟ, බොහෝ කම්කරුවන් ක්ෂණික සහයෝගයක් නොමැතිව අර්බුදයක සිරවී සිටින්නට විය.

ගංවතුරට ලක් වූ මාර්ග සහ අවහිර වූ ප්‍රවාහන ජාලයන් නිසා බොහෝ නිදහස් වෙළඳකලාප සේවකයින්ට ඔවුන්ගේ කර්මාන්තශාලා වෙත ළඟා වීමට නොහැකි විය. දෛනික පැමිණීම, අතිකාල සහ නිෂ්පාදන දිරිගැන්වීම් මත ආදායම රඳා පවතින කම්කරුවන් සඳහා, රැකියාවක් නොමැතිව දින ගණනාවක් ගතවන්නට විය. මෙය අහිමි වූ වැටුප්, ඉක්මනින් නොගෙවූ කුලිය, වැඩිවන ණය සහ ආහාර අනාරක්ෂිතභාවය බවට පරිවර්තනය විය. ජාතික අපනයන ආදායමට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නද, ව්‍යසනයේ ආර්ථික බරට පමණක් උරදීමට නිදහස් වෙළඳ කලාප සේවකයින්ට සිදුවිය. එසේම උතුරු ප්‍රදේශයේ තවත් කර්මාන්තශාලාවක් තුළ සේවක සේවිකාවන් සඳහා ගංවතුර මධ්‍යයේ ද ආරක්ෂිත කඳවුරු වල සිටියා වුවද රැකියාව වෙත යාමට සිදු විය. ඒ සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීමටතරම් කර්මාන්තශාලා කර්ය මණ්ඩලය කාර්යක්ෂම වූයේ සේවකයින්ගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය දැවත් ලබා දීමට තරම්වත් හිත් නොවූ අමානුෂික පරිසරයක් මධ්‍යයේය.

එසේම බොහෝ නිදහස් වෙළඳ කලාප සේවක සේවිකාවන් වෙත රජය විසින් ලබා දෙන නිල ආපදා සහනවලින් බැහැර කරනු ලැබුවේ ඔවුන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල ස්ථිර ලිපිනයන් නොමැති කුලී නිවැසියන්, තාවකාලික පදිංචිකරුවන් හෝ සංක්‍රමණිකයන් වූ බැවිනි. සහන බෙදා හැරීමේ පද්ධති බොහෝ දුරට නේවාසික නිවාස සේවකයින් අවධානමට ලක්විය හැකි කණ්ඩායමක් ලෙස හඳුනා ගැනීමට අපොහොසත් විය. මෙම ව්‍යුහාත්මක බැහැර කිරීම දිගුකාලීන ප්‍රතිපත්ති අසාර්ථකත්වයක් ඉස්මතු කරයි. නිදහස් වෙළඳ කලාප සේවකයින් ආරක්ෂාව සඳහා හිමිකම් ඇති පුරවැසියන්ට වඩා ඉවත දැමිය හැකි ශ්‍රමිකයන් ලෙස සලකනු ලැබේ. වැටුප් සහිත ආපදා නිවාඩු, හදිසි ආදායම් ආධාර හෝ නිවාස ආධාර නොමැතිකම කාර්මික සේවකයින්ට බලපාන අර්බුදවලට සූදානම් නොවූ ආයතන ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය හෙළි කළේය.

ඒ අනුව නිදහස් වෙළඳ කලාප සේවකයින් ආරක්ෂා කිරීම සඳහා තාවකාලික සහනවලට වඩා වැඩි යමක් අවශ්‍ය වේ - එය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, සේවා යෝජකයින්ගෙන් වගවීම සහ සේවකයින් අයිතිවාසිකම් ඇති පුරවැසියන් ලෙස පිළිගැනීම ඉල්ලා සිටින වග අප මෙහි දී අවධාරණය කරමු.

රශ්මි වීරක්කුට්ටි

# ගංවතුරෙන් අවතැන් වූ අපේ කම්කරු සහෝදර සහෝදරියන් වෙනුවෙන් පොදු කුස්සියක්





දිට්වා සුළිකුණාටුවෙන් විපතට පත් නිදහස් වෙළඳ කලාපයේ කම්කරු සේවක සේවිකාවන් වෙනුවෙන් 2025 දෙසැම්බර් 11 වන දින ධාබිඳු සාමූහිකයේ අපි බියගම සහ කටුනායක ප්‍රදේශයන්වල සැමට පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දීම අරමුණු කර ගනිමින් පොදු කුස්සියක් සංවිධානය කරනු ලැබීය. එහි දී විපතට පත් කම්කරු සහෝදර සහෝදරියන් 135 දෙනෙක් වෙනුවෙන් කෑම පාර්සල් බෙදා දීමට අපට හැකි විය. එසේම මෙම ප්‍රදේශයන් තුළ වියළි සලාක මලු බෙදා දීමද සිදු කෙරිණි. තවද විපතට පත් කිලිනොච්චි, වව්නියා ප්‍රදේශන්හි කර්මාන්තශාලාවල සහෝදර සහෝදරියන් 225 දෙනෙකු වෙනුවෙන් වියළි සලාක මලු බෙදා දීම සිදු කරන් ලැබිණි. එසේම 2026 ජනවාරි මස 25 දින කටුනායක ප්‍රදේශයේ ගංවතුරෙන් පීඩාවට පත් 75 දෙනෙකු වෙනුවෙන් වියළි සලාක සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය බෙදා දීම සිදු කරන ලදී.

# ආන්තික ප්‍රජාවන්හි කාන්තාවන්ගේ දේශපාලනික සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා නව ක්‍රියාකාරීත්වය

ධාබිඳු සාමූහිකය එහි ආයතනික ගමනේ නව අදියරක් ලෙස විශේෂයෙන් ආන්තික ප්‍රජාවන්හි කාන්තාවන්ගේ දේශපාලනික සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අවධානය යොමු කරමින් ආරම්භ කර ඇත. මෙම මුලපිරීම විශේෂයෙන් ඇඟලුම් අංශයේ, ධීවර ප්‍රජාවන්හි සහ වැවිලි අංශවල කාන්තාවන්ට ප්‍රමුඛත්වය දෙන අතර, මෙම කාන්තාවන් ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන අතර, ඔවුන් දේශපාලන සහභාගීත්වයෙන් සහ පුළුල් සමාජ තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ගෙන් ක්‍රමානුකූලව බැහැර කරනු ලබන බව හඳුනා ගනී. මෙම කාන්තාවන්ට දේශපාලනයට සහ අනෙකුත් ආකාරයේ සමාජීය සහ සිවිල් මැදිහත්වීම්වලට සම්බන්ධ වීමට සමාන අයිතියක් ඇති බව ධාබිඳු සාමූහිකය තරයේ තහවුරු කරයි.

ඒ අනුව 2025 සැප්තැම්බර් මාසයේ දී ව්‍යාපෘතිය දියත් කිරීමෙන් පසු ආරම්භක පියවරක් ලෙස, ධාබිඳු සාමූහිකය කාන්තා දේශපාලන සහභාගීත්ව ක්ෂේත්‍රයේ දශකයකට වැඩි පළපුරුද්දක් ඇති විශේෂඥයින්ගෙන් සමන්විත උපදේශක කමිටුවක් පිහිටුවන ලදී. පළමු උපදේශක කමිටු රැස්වීම 2025 දෙසැම්බර් 12 වන දින පවත්වන ලද අතර එය ධාබිඳු සාමූහිකයේ විධායක අධ්‍යක්ෂ චමිලා තුෂාරි මහත්මිය සහ ව්‍යාපෘති කණ්ඩායම විසින් පවත්වන ලදී. උපදේශක කමිටුවට ආචාර්ය සේපාලි කෝට්ටේගොඩ, තරංගා ද සිල්වා මහත්මිය, උදේනි තෙවරප්පෙරුම මහත්මිය, සුමිකා පෙරේරා මහත්මිය සහ කුමුදිනී සැමුවෙල් මහත්මිය ඇතුළත් වේ. රැස්වීම අතරතුර, ව්‍යාපෘති අරමුණු, සැලසුම් කළ ක්‍රියාකාරකම් සහ ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග ඉදිරිපත් කර විස්තරාත්මකව සාකච්ඡා කරන ලදී. ව්‍යාපෘතියේ සුමට, ඵලදායී සහ සන්දර්භීයව ප්‍රතිචාරාත්මක ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා උපදේශකයින් මිල කළ නොහැකි අවබෝධයක් සහ උපායමාර්ගික මග පෙන්වීමක් ලබා දුන්හ.

# වව්නියාවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් සංවේදීකරණය කිරීමේ වැඩසටහන



දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවය කරන නිලධාරීන් සඳහා වන සංවේදීකරණ වැඩසටහනක් 2026 ජනවාරි 08 වන දින වව්නියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පවත්වන ලදී. එහි දී වන්නේ වවුනියාව දිස්ත්‍රික්කයේ ඇඟලුම් කම්හල් සේවකයින් සඳහා රාජ්‍ය සේවාවන්හි හඳුනාගත් හිඩැස් සඳහා ඵලදායී විසඳුම් සෙවීම අරමුණ විය. මෙම සැසිවාරවලට අතීත වාර්තා සමාලෝචනය කිරීම, වත්මන් ගැටළු සාකච්ඡා කිරීම, ක්‍රියාකාරී නිර්දේශ ඉදිරිපත් කිරීම සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අඛණ්ඩ සහයෝගීතාවය සාකච්ඡා කිරීම ඇතුළත් විය. වැඩසටහන සඳහා ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරි, මුල් ළමාවිය සංවර්ධන නිලධාරි, කාන්තා සංවර්ධන නිලධාරිනිය, ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධාරියා, උපදේශන සහකාර, මත්ද්‍රව්‍ය නිවාරණ නිලධාරි සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසම් භාර ග්‍රාම නිලධාරීවරුන් සහ සංවර්ධන නිලධාරී ඇතුලු රාජ්‍ය නිලධාරීන් 25ක් ඊට සහභාගී වූ අතර ගෘහස්ථ හිංසනයන් සම්බන්ධව දැනුවත් කිරීම, සම්පූර්ණ කිරීම, කාන්තාවන් ශක්තිමත් කිරීම, කාන්තා කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වැනි මාතෘකා යටතේ පුළුල් ලෙස වැඩසටහන සාකච්ඡාවට ලක් කරන ලදී. කාලීනව කර්මාන්තශාලාවල සේවය කරන කාන්තාවන් මුහුණ දෙන ගැටළු සම්බන්ධයෙන් ඩාබිඳු කණ්ඩායම විසින් රැස් කරන ලද රජයේ තොරතුරු නිලධාරීන් සමඟ සාකච්ඡා කළ අතර වැඩි දුරටත් සාකච්ඡා කළ ගැටළු සම්බන්ධයෙන් ඩාබිඳු කණ්ඩායමේ දී නිර්දේශ ඉදිරිපත් කර දිගටම රාජ්‍ය නිලධාරීන්ගේ ප්‍රායෝගික හැකියාව පිළිබඳ නිර්දේශයන් ලබා ගැනීම සිදු විය.



# වව්නියාවේ කම්කරු කාන්තාවන් සඳහා සඳහා මනෝ උපදේශන ලබාදීමේ වැඩසටහනක්

කර්මාන්තශාලාවල සේවය කරන කම්කරු කාන්තාවන් සඳහා උපදේශන ලබා දීමේ වැඩසටහන් දෙකක් සාර්ථක ලෙස සිදු කරන ලදී. 2025.12.14 දින මරක්කරම්පලෙයි ග්‍රාමසේවා වසමේ කර්මාන්තශාලා තුළ වැඩ කරන සේවිකාවන් 05 දෙනෙකුට සහ දෙවන වැඩසටහන 2025.12.21 දින ශිවපුරම් වසමේ කර්මාන්තශාලා තුළ වැඩ කරන සේවිකාවන් 05 දෙනෙකුට මනෝ උපදේශන වැඩසටහනක් පැවැත්වීය. එහි දී වැඩසටහන් සම්පත්දායිකා ලෙස තුෂාන්තන් ප්‍රියදර්ශනී මහත්මිය සහභාගී විය. ඒ හරහා කණ්ඩායම් සාකච්ඡා සැසියකින් අනතුරුව පෞද්ගලික උපදේශන සැසි පැවැත්වීම සිදු කරන ලදී. එයින් පුද්ගලික ගැටළු බෙදා හදා ගැනීමට සහ ඊට අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට සේවාලාභීන් සමත්විය.

# ඩාබිඳු සාමූහිකයේ 2025 වාර්ෂික මහ සභා රැස්වීම හා ඩාබිඳු සාමූහික සංගමයේ 5 වන මහා සභා රැස්වීම







ඩාබිඳු සාමූහිකය මෙවර සිය ගමන් මගේ 41 වන කඩඉම සමරනු ලබන්නේ නිහතමානී ආඩම්බරයකිනි. ස්ත්‍රී සංවිධානයක් වශයෙන් ඇඟළුම් ක්ෂේත්‍රයේ කම්කරු කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම කාලය තුළ අප සිදු කළ මෙහෙවර අපමණය.

41 වසරක අභිමානය රැගත් ඩාබිඳු සාමූහිකයේ 2025 වසරේ වාර්ෂික මහ සභා රැස්වීම 2026 ජනවාරි මස 04 වනදා පෙරවරු 10.30 සිට අතිඋත්කර්ෂවත්ව කටුනායක මධ්‍යම කුරණ බහු කාර්ය ගොඩනැගිල්ලේ දී පවත්වනු ලැබූ අතර මෙම වැඩසටහනට අපගේ සමාජිකයින් කටුනායක, බියගම නිදහස් වෙළඳ කලාප නියෝජනය කරමින් 60 දෙනෙකුත් කිළිනොච්චි සහ වවුනියා කාර්මික ප්‍රදේශ නියෝජනය කරමින් 60 දෙනෙකුත් සම්බන්ධ වූ අතර ඔවුන් සෑම ජාතියක් ම ආගමක් ම නියෝජනය කිරීම අප ලද භාග්‍යයකි. එපමණක් නොව අප හා නිරන්තර සහයෝගයෙන් කම්කරු ප්‍රජාවේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින සිවිල් සමාජ සංවිධාන වන නිමි භාණ්ඩ හා ඇඟළුම් සේවක සංගමය, වතුකරයේ ජනතා හඬ සංවිධානය, ප්‍රජා සහෝදරත්වය සංවිධානය, ස්ටෑන්ඩ් අප් මූව්මන්ට් ලංකා සංවිධානය, පුරවැසි කමිටුව හා මානව හිමිකම් කේන්ද්‍රය සහභාගීත්වය සඳහන් කළ යුතුම ය. එපමණක් නොව වසර පුරා ආයතනික මඟ පෙන්වීම සහ නායකත්වය ලබා දුන් අපගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ද සහභාගීත්වය සිහිපත් කළ යුතු ය.

පොල්තෙල් පහන් දල්වාලමින් චාරිත්‍රානුකූලව මහ සභා රැස්වීම ඇරඹූ අතර දිවන්ගත ඩාබිඳු සාමූහිකයේ නිර්මාතෘ සමන්මලී හෙට්ටිආරච්චි මහත්මියගේ මතක ආවර්ජනා කිරීම සුවිශේෂී අවස්ථාවකි. ඉන් අනතුරුව ඩාබිඳු සාමූහිකයේ විධායක අධ්‍යක්ෂිකා චමිලා තුෂාරී මහත්මිය විසින් ඩාබිඳු ඉතිහාසය සහ පසුගිය වසරෙහි ක්‍රියාකාරීත්වය ද ඉදිරිපත් කරන ලදී. ඩාබිඳු සාමූහිකයේ 2024-2025 ක්‍රියාකාරීත්වය පිළිබඳ සංශිප්ත ප්‍රගති වාර්තාව වැඩසටහන් කළමානාකාරීතුමිය විසින් ද ගිණුම් වාර්තාව මූල්‍ය නිළධාරීතුමිය විසින් ද ඉදිරිපත් කරන ලදී. කටුනායක, බියගම නිදහස් වෙළඳ කලාප නියෝජනය කරමින් සහ කිළිනොච්චි සහ වවුනියා කාර්මික ප්‍රදේශ නියෝජනය කරමින් කාන්තා සේවිකාවන් සිව් දෙනෙකු තම අදහස් බෙදා ගැනීම ජීවය සැපයී ය.

ඊට සමාගමීව ඩාබිඳු සාමූහික සංගමයේ 5 වන මහා සභා රැස්වීම සභාපතිතුමිය විසින් ඇරඹූ අතර පසුගිය සභා වාර්තාව සහ ලේකම් වාර්තාව ප්‍රධාන ලේකම්තුමිය විසින් ද ගිණුම් වාර්තාව භාණ්ඩාගාරිකතුමිය විසින් ද ඉදිරිපත් කරන ලදී. අවසානයේ දී පැරණි නිළධාරී මණ්ඩලය වෙනස් කොට නව නිළධාරී මණ්ඩලය පත් කිරීම සිදු කරන ලදී.

යසාරා විදුමිණි

# බදු යුක්තිය සඳහා කලාපීය සහයෝගීතාවය: දකුණු ආසියානු දරිද්‍රතාවය තුරන් කිරීමේ සන්ධානය කොළඹ දී ඒකාබද්ධ සංසද පවත්වයි



දකුණු ආසියානු දරිද්‍රතාවය තුරන් කිරීමේ සන්ධානය 2025 දෙසැම්බර් 10 - 11 දිනවල ශ්‍රී ලංකාවේ කොළඹ දී සිවිල් සමාජ සංවිධාන ධාරිතා වර්ධනය පිළිබඳ ඒකාබද්ධ කලාපීය සංසදය සහ සාධාරණ බදුකරණය පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රී සංසදය සාර්ථකව කැඳවීය. දිට්වා සුළි කුණාටුවේ විනාශකාරී බලපෑම් වලින් පසු ශ්‍රී ලංකාව යථා තත්ත්වයට පත් කිරීමේ උත්සාහයන් අඛණ්ඩව කරගෙන යන බැවින්, තීරණාත්මක මොහොතක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ කලාපීය සහචරයින් මේ සඳහා එක්වීය.

සංසදවල මූලික අරමුණ වූයේ අසමානතාවය අඩු කරන, මහජන සේවා ශක්තිමත් කරන සහ ආර්ථික යුක්තිය ඉදිරියට ගෙන යන සාධාරණ, විනිවිද පෙනෙන සහ ප්‍රගතිශීලී බදු පද්ධති ගොඩනැගීම සඳහා කලාපීය සංවාදය සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමයි. සිවිල් සමාජ සංවිධාන, කාන්තා කණ්ඩායම්, ගොවි සහ කම්කරු සම්මේලන, තරුණ නියෝජිතයින්, මාධ්‍යවේදීන් සමඟ නේපාලය, ඉන්දියාව, පකිස්ථානය, ශ්‍රී ලංකාව සහ මාලදිවයිනේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මේ සඳහා සහභාගී වූහ.

"දකුණු ආසියාවට සාධාරණ බදුකරණය වැදගත් වන්නේ ඇයි" යන මැයෙන් පැවති පූර්ණ පාර්ලිමේන්තු සැසිවාරය ප්‍රධාන කැපී පෙනෙන අංගයක් විය. කීර්තිමත් කථිකයින් අතර ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී, නීතිඥ ආර්ථික සංවර්ධනය සහ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුවේ සභාපති ලක්මාලි හේමචන්ද්‍ර (ශ්‍රී ලංකාව), පාර්ලිමේන්තු මන්ත්‍රී අහමාර් භාටි (පකිස්තානය), උතුරු ෆෙයිධූ මැතිවරණ කොට්ඨාශයේ පාර්ලිමේන්තු මන්ත්‍රී පාර්ලිමේන්තු කමිටු සාමාජිකත්වය දරන ගරු ඉස්මයිල් නිසාර් (මාලදිවයින), සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ ජාතික සැලසුම් කොමිසමේ හිටපු සාමාජික ආචාර්ය දිල්ලි රාජ් ඛනාල් (නේපාලය) යන මහත්වරුන් ඇතුළත් විය. ශ්‍රී ලංකාවේ කම්කරු නියෝජ්‍ය අමාත්‍ය ගරු මහින්ද ජයසිංහ මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අදහස් දැක්වූ අතර, කම්කරුවන්ට සහ මහජන සුභසාධනයට සහාය වීමේදී සාධාරණ බදුකරණයේ වැදගත්කම අවධාරණය කළේය. බදු ප්‍රතිසංස්කරණ සහ ආර්ථික පාලනය පිළිබඳ ජාතික අත්දැකීම් සහ කලාපීය ඉදිරිදර්ශන ඔවුන් විසින් බෙදා ගන්නා ලදී. සැසිය ආකර්ශනීය ප්‍රශ්නෝත්තර සහ විවෘත සාකච්ඡාවකින් අවසන් විය.

දකුණු ආසියාව පුරා බදු යුක්තිය සහ අසමානතාවයන් අවම කිරීම සඳහා සහයෝගීතාව ගැඹුරු කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, විශේෂඥයින් සහ සහචරයින් අතර බෙදාගත් කැපවීම පිළිබඳ දැඩි හැඟීමකින් සංසද අවසන් විය.

# මානව හිමිකම් සුරක්ෂිත සමාජයක් ගොඩනගමු

සෑම වසරකම දෙසැම්බර් මස 10 වන දිනට යෙදෙන මානව හිමිකම් දිනය යළි යළිත් ලෝකයට සිහිපත් කරන්නේ සෑම මිනිසෙක්ම ඉපදී ඇත්තේ නිදහසේ ජීවත්වීමට හා සමානාත්මකව සැලකුම් ලැබීමේ අයිතියක් සමඟින් බවයි. මනුෂ්‍ය හිමිකම් ආරක්ෂා කිරීමට ගත් ඉතිහාසගත වගකීමක් ලෙස 1948 දී ආරම්භක වූ ලෝක මානව හිමිකම් ප්‍රකාශනය (UDHR) ජාතීන් විසින් පිළිගත්තේ ගෝලීය මට්ටමින් මූලික මානව නිදහස සහ යුක්තිය ආරක්ෂා කිරීම සඳහාය.

නමුත් අදටත් බොහෝ ඇඟළුම් ක්ෂේත්‍රයේ නියුතු කම්කරු කාන්තාවන්ට මෙම අයිතිය ලැබී ඇති බවක් පෙනෙන්නට නැත. ඇඟළුම් කම්කරු කාන්තාවන් යනු ශ්‍රී ලංකාවට ඩොලර් ගෙනෙමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමට පදනම සකසන්නියන්ය. නමුත් ඔවුන් මෙම වැදගත් කාර්යය කාර්යක්ෂමව සම්පූර්ණ කරන්නේ ඔවුන්ගේ මානව අයිතිවාසිකම් දිගින් දිගටම කඩවන පසුබිමකය.

දීර්ඝ වැඩ පැය, අඩු වැටුප්, රැකියාවේ අවිනිශ්චිත බව, ලෙඩ නිවාඩුවකදී පවා කැපෙන පැමිණීමේ දීමනාව, සමාජයෙන් ආරක්ෂාවක් නොමැති බව සහ ආරක්ෂාවක් නැති සෞඛ්‍යයට අහිතකර වැඩ පරිසරය සියළුම කම්කරු කාන්තාවන් මුහුණ දෙන පොදු ගැටළු වේ. ඒ පමණක් නොවෙයි අපහාස, හිංසා, ලිංගික අපචාර, නිදහස සීමා කිරීම් සහ සාමූහික කේවල් කිරීමේ අයිතිය යන්න කාන්තාවන් වීම නිසාම ඔවුන්ට බැටකන්නට සිදුවී ඇති ප්‍රශ්නයි.

මෙපමණක් නොව නිදහස් වෙළඳ කලාපවලට පිට පළාත්වලින් පැමිණෙන බෝඩිම් කාමරවල ජීවත්වන කාන්තාවන් මුහුණපාන්නේ අක්‍රමවත් නේවාසිකාගාර ගැටළු, සනීපාරක්ෂක ගැටළු සහ සමාජයෙන් සිදුවන කොන්කිරීම්වලටය. එමෙන්ම කාන්තාවකට අවශ්‍යම ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය හිමිකම් පිළිබඳ තොරතුරු සහ සේවා සීමිත වුවද සමාජය විසින් කාන්තාවන්ට ඔවුන්ගේ අවශ්‍යතා සහ හිමිකම් සඳහා විවෘතව කතා කිරීමට සීමාවන් පනවා ඇත.

මෙම ජාත්‍යාන්තර මානව හිමිකම් දිනයේ දී අප රජයෙන්, සේවා සපයන්නන්ගෙන් සහ සමාජයෙන් ඉල්ලා සිටින්නේ කම්කරු හිමිකම් සහ කාන්තා හිමිකම් මූලික මානව අයිතිවාසිකම් බව පිළිගන්නා ලෙසයි; තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී කම්කරු කාන්තාවන්ගේ හඬ සැලකිල්ලට ගැනීමටත් ඔවුන්ට ගෞරවය ලබාදීමටත් කටයුතු කරන ලෙසයි; සාධාරණ වැටුප, ආරක්ෂිත වැඩ පරිසරය, සමාන අවස්ථා හා සමාන කොට සැලකීම්, ප්‍රකාශ කිරීමේ නිදහස සහ කාන්තාවන්ට ඔවුන්ගේ ශරීරය ඔවුන්ටම පාලනය කිරීමට ඉඩ දෙන ලෙසයි.

මෙම මානව හිමිකම් දිනයේ දී ඩාබිඳු සාමූහිකය විසින් කාන්තාවන්ට ගෞරවය, සමානාත්මතාවය සහ නිදහස සහිතව ජීවත් වීමට සහ රැකියාව කිරීමට හැකි විය යුතු සාධාරණ සහ සම්මත සමාජයක් නිර්මාණය කිරීමේ උත්සහය තව දුරටත් ශක්තිමත් කිරීමේ පොරොන්දුව ලබා දෙමු.

රුවිනි සකුන්තලා

# සිතුවිල්ල

ගංවතුර හරියට අපිව ගිල ගන්න ඉන්න රකුසෙක් වගේ. හැමදාම අපේ දේවල් ගංවතුරට ගසාගෙන යන්නේ අපේ අනාගතයත් එක්කමයි. ජීවිතේ ගැට ගහන්න ගහන ගේම දන්නේ අපි විතරයි. ඒකටත් හෙනහුරා කඩා පාත් වෙනවා... සයිකො පාරක් ගහන්න ඇඳට වැටුනා විතරයි සුරංගිගේ දුක් ගැනවිල්ල. කතාව ඇත්ත. බෝඩිං කාමර පිටින් යට උනු අපේ කෙල්ලෙක්ට. තාවකාලික උරුමය වූ කාමර යට වීම, මහා මාර්ග අවහිර වීම, ජල පහසුකමේ සිට උපයාගත් සේසතම ගහගෙන ගිය නිසා ආයෙම සැරයක් බලාපොරොත්තු සුං වුනා. මේ කතාවල දුක පාලකයින්ට දැනෙන්නේ නෑ. රාජමනී කියනවා ඇහුනා කිලිනොච්චියේ ගෙවල් වල වහල නෑ කියලා. ගොම මැටි ගෙදරවල් තවමත් වේලෙන්නේ නැලු. කොට්ට මෙට්ට වේලගන්න වෙලාවක් නැලු. හැබැයි අපිට වැඩට එන්න කියනවා මදිවට අපේ පැමිණීමේ දීමනාව, වාර්ෂික ප්‍රසාද දීමනා වලින් මෙන්ම කවරින් කිරීමටද නොමිලේ අතිකාල කිරීමටද සැලසුම් ගහලා. ලංකාවට බලපාපු මේ ව්‍යසනයට වන්දි ගෙවන්න ඕනේ අපිද? තාවකාලික පදිංචිකරුවන් කියලා ග්‍රාම නිළධාරී ළඟට ගියාම සමහර සේවිකාවන්ට කිසිම ප්‍රතිපාදනයක් ලබා දෙන්න බෑ කිව්වලු. අපි කොට්ට මෙට්ට වේල වේල දැගලුවට... බෝඩිං ඇන්ටි ඒව විසිකරලා අලාභවලට වන්දිත් ගත්තා. අපි ගැන බලන්න කවුරුත් නෑ. අවට පන්සල්, පල්ලි නැත්නම් අපිට ආගිය අතක් නැති වෙනවා. කොහෙන් හරි කෑම වේලක්, වතුර බෝතලයක් ලැබෙනකම් අපිට බලාගෙන ඉන්න වෙලා. මේ ගංවතුර අරගෙන යන්නේ අපේ බලාපොරොත්තු, අපේ අනාගතය. අවුරුදු ගාණක් වැඩකරලා අපි රැස් කරන්නේ 10×12 කාමරයකට අත්‍යවශ්‍ය බඩු විතරයි. ඒකත් නැති වුනාම අපි කොහොමද හෙට ගැන හිතන්නේ. ඇයි අපි ගැන බලන්න වැඩපිළිවෙලක් හැදෙන්නේ නැත්තේ. තාවකාලික පදිංචිකරුවන් වෙන්න වුනේ අපේ වරදින්ද? ඒවාට වැඩපිළිවෙළක් හදන්න නිළධාරීන්ට වගකීමක් නැද්ද? අපි මේ රටට පුරවැසියන් වෙන්නේ ඩොලර් ගේන්න විතරද? අපි කීයෙන් කී දෙනාටද බිම් අඟලක් හිමිව ඇත්තේ. ගේ දොර හදා ගැනීම අපේ හීනවලටම සීමා වෙලා... අලුත් අවුරුද්දක් උදා වුනා. අපේ සිහිනවලට පණ දෙන්න බලධාරීන්ගේ නෙත් යොමු වේවා...

සමන්තා

# ප්‍රහේලිකා අංක - 54

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | | ■ | 2 | | 3 | |
| | ■ | 4 | ■ | ■ | | ■ |
| 5 | | | ■ | 6 | | |
| | ■ | ■ | 7 | ■ | | ■ |
| ■ | 8 | 9 | | ■ | | ■ |
| 10 | | | ■ | 11 | | |

## හරහට


1. දකුණ නොවේ.
2. මහද්වීපයකි.
5. නිවෙස්වල සුරතලයට ඇති කරයි.
6. රාත්‍රී කාලයට වැටේ.
8. අවුරුදු කාලවල මේවා ගසයි.
10. බීමට ගනී.
11. ඉස්කෝලයට තවත් නමකි.

## පහළට

1. එළවළු වර්ගයකි.
3. පුරාණයේ විසූ රජ කෙනෙකි.
4. මුකුණුවැන්න... වර්ගයකි.
7. පැදුරු වියා ගැනීමට මේවා ගනී.
8. වර්ණයකි.
9. ස්කන්ධයට සමාන වචනයකි.

**මෙම ප්‍රහේලිකාව නිවැරදිව පුරවා පහත සඳහන් ලිපිනයට ඒවා මුදලින් රු.1000 ක් වටිනා තෑගි දිනාගන්න.**

**ඩාබිඳු සාමුහිකය**
**221, වෙළබඩ පාර, කටුනායක.**
**දුරකථන අංකය: 077 725 9892**




# විදෙස් පුවත්

2025 අවසානයේ දී සහ 2026 ආරම්භයේ දී ගෝලීය වෙළඳ ප්‍රතිපත්ති තුළ සිදු වූ වෙනස්කම් - විශේෂයෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේ (USA) ආනයනික භාණ්ඩ සඳහා නැවත ඉහළ නැංවූ තීරු බදු ඇඟලුම් කර්මාන්තයට විශාල බලපෑමක් සිදු කර ඇත. මෙම තත්ත්වය දකුණු ආසියානු රටවල්වල මෙන්ම ශ්‍රී ලංකාවේ ඇඟළුම් සේවිකාවන්ගේ ජීවිතවලටද සෘජුවම බලපාන තත්ත්වයක් බවට පත්ව ඇත.

2025 දී ඇමරිකා එක්සත් ජනපදය විසින් ඇඟලුම් නිෂ්පාදන සඳහා ඉහළ තීරු බදු යළි හඳුන්වා දීමත් සමඟ ගෝලීය වෙළඳ සන්නාම සහ වෙළඳ සමාගම් තම නිෂ්පාදන සැපයුම් රටවල් නැවත සලකා බැලීමට පෙළඹී ඇත. මෙහි ප්‍රතිඵල ලෙස ඇණවුම් අවලංගු වීම, නිෂ්පාදන ප්‍රමාණය අඩු කිරීම, මිල අඩු කිරීමට කර්මාන්තශාලා වෙත බලපෑම් කිරීම වැනි තත්ත්වයන් වාර්තා වී ඇත. මෙවැනි තීරණවලින් වැඩිම බර වැටෙන්නේ ඇඟලුම් කර්මාන්තයේ වැඩ කරන කාන්තාවන්ටය, විශේෂයෙන්ම රැකියා අස්ථිරතාව, වැඩ කාලය අඩුවීම සහ ආදායම් පහත වැටීම වැනි ගැටළු හරහාය.

ශ්‍රී ලංකාවේ ඇඟලුම් අපනයන වලින් සැලකිය යුතු කොටසක් ඇමරිකානු වෙළඳපොළට යොමු වේ. එම නිසා ඇමරිකානු තීරු බදු ඉහළ යාමත් සමඟ ශ්‍රී ලාංකික නිෂ්පාදන මිල ද තරඟකාරීත්වයෙන් පසුබැසීමේ අවදානමකට ලක්ව ඇත. මෙම කර්මාන්තය නියෝජනය කරන ආයතන අනතුරු ඇඟවීම් කර ඇත්තේ අපනයන ආදායම් අඩුවීම, කර්මාන්තශාලා තුළ රැකියා අවදානම වැඩිවීම, ඇණවුම් වෙනත් රටවල් වෙත මාරු වීම වැනි තත්ත්වයන් ඇති විය හැකි බවයි.

මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ ඇඟලුම් සේවිකාවන්ගේ රැකියා ආරක්ෂාව, වැටුප් සහ වැඩ කිරීමේ අයිතිවාසිකම් පිළිබඳ ගැටළු තවදුරටත් තීව්‍ර කරයි. බොහෝ ඇඟලුම් සේවිකාවන් තම පවුල්වල ප්‍රධාන ආදායම් උපයන්නන් වන අතර, ගෝලීය වෙළඳ ප්‍රතිපත්ති වෙනස්කම් නිසා ඇතිවන රැකියා අහිමි වීමේ අවදානම, වැඩ කාලය හා අමතර වැටුප් අඩුවීම, අනාගත රැකියා අවස්ථා සීමා වීම වැනි තත්ත්වයන් ඔවුන්ගේ ජීවන ආරක්ෂාවට සෘජුවම බලපායි.

මෙම ගෝලීය තත්ත්වය මඟින් පැහැදිලි වන්නේ, ගෝලීය වශයෙන් ගන්නා වෙළඳ හා ආර්ථික තීරණ ඇඟළුම් සේවිකාවන්ගේ දෛනික ජීවිතයට දැඩි බලපෑම් ඇති කරන ආකාරයයි. එබැවින් සේවිකාවන්ගේ අයිතිවාසිකම් රැක ගැනීම, සාධාරණ වැටුප් සහ ආරක්ෂිත රැකියා සඳහා ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් වඩා ශක්තිමත් ප්‍රතිචාර අවශ්‍ය වේ.

**"Tracking the impact of US tariffs on apparel & footwear supply chains" – Business & Human Rights Resource Centre**

# වන්දි සූත්‍රය

## සේවා යෝජකයකුට තමන්ට අවශ්‍ය වේලාවට සිය සේවකයින් ඉවත් කළ හැකිද?

රටේ පවතින නීතිය අනුව,

1. කම්කරු කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව,
2. හෝ සේවකයාගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව.
   - අ. සේවකයින් 15 කට වඩා සේවයේ යොදවා ඇති
   - ආ.වසරකට වැඩි කාලයක් සේවය කර ඇති සේවා ස්ථානයක සේවය කර ඇති සේවකයෙකුගේ සේවය අවසන් කිරීමට සේවායෝජකයෙකුට නොහැකිය.

කම්කරු දෙපාර්තමේන්තුව වත්මන් ශ්‍රම බලකාය ඉවත් කර නව සේවකයින් සමඟ නැවත ආරම්භ කිරීමට අවසර නොදේ.

**වන්දි සූත්‍රය අනුව සේවායෝජකයා විසින් ගෙවිය යුත්තේ:**

පළමු වසර 5 සඳහා මාස 2 1/2 ක වැටුප,

ඊළඟ වසර 9 සේවා කාලය සඳහා මාස 2 ක වැටුප,

ඊළඟ වසර 5 සඳහා මාස 1 1/2 ක වැටුප,

ඊළඟ වසර 5 සඳහා මාස 1 ක වැටුප,

ඉදිරි වසර 10 ක සේවා කාලය සඳහා මාස 1/2 ක වැටුප.

සේවකයෙකු වසර 34 ක් සේවය කර ඇත්නම් වන්දි වශයෙන් මාස 48 ක වැටුපක් ගෙවිය යුතුය.

සේවායෝජකයාට නැවත සේවය ආරම්භ කිරීමට අවශ්‍ය නම්, ඔහු මුලින්ම පැරණි සේවක මණ්ඩලය බඳවා ගත යුතුය.

සේවායෝජකයෙකු අපේ සාමාජිකයින්ගේ සේවය අවසන් කරන බව පවසා ඇත්නම්, ඔවුන්ට අවශ්‍ය වන්නේ අපගේ සාමාජිකයින් තුළ යම් බියක් ඇති කිරීමට පමණි. මෙම පදනම් විරහිත කතා ගැන කිසිසේත් අවධානය යොමු නොකරන්න. සේවකයින් තවදුරටත් රවටා ගත නොහැකි බැවින් ඔවුන් කනස්සල්ලට පත්ව සිටිති.

අන්තර්ජාලය ඇසුරෙනි

# දිට්වා සුළි කුණාටු තත්ත්වය හමුවේ ආපදාවට පත් වූ උතුරේ සහ ගම්පහ දිස්ත්‍රික්කයේ කම්කරුවන් වෙනුවෙන් වියළි සළාක බෙදා හැරීම









අංක: 221, වෙළබඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.